\



## ඉල්ලුම්පත්‍රය සම්පූර්ණකිරීම සඳහා අවශ්‍ය උපදෙස්

**පහත දක්වා ඇති උපදෙස් අනුව අයදුම්පත සම්පූර්ණ කළ යුතුයි.**

1. පූජ්‍ය/මහතා/මහත්මිය/මෙනවිය වැනි අදාල නොවන වචන කපා හැරිය යුතුය. ජාතික හැඳුනුම්පතේ සඳහන් වන පරිදි සම්පූර්ණ නම ලිවිය යුතුය.

   උදා: දිසානායක මුදියන්සේලාගේ නාමල් දිසානායක

2. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු අතර, එක් අකුරක් සඳහා එක් කොටුවක් බැගින් භාවිතා කළ යුතුය.

   උදා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| D | . | M | . | N | . | D | I | S | S | A | N | A | Y | A | K | A |

3. නව විදුලි සේවා සැපයුම ලබා ගැනීමට යෝජිත පරිශ්‍රයෙහි ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කළ යුතු අතර, එක් අකුරක් සඳහා එක් කොටුවක් බැගින් භාවිතා කළ යුතුය.

4. නව විදුලි ගිණුම ආරම්භ වන තෙක් වෙනත් ස්ථානයකට ලිපි ලැබිය යුතු නම් පමණක් එහි ලිපිනය සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කල යුතු අතර, එක් කොටුවකට එක් අංකයක් වන පරිදි සඳහන් කල යුතුය.

   වලංගු ජාතික හැඳුනුම්පතක් නොමැති නම් පමණක්, අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා වෙනත් වලංගු ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරුගේ ස්ථාවර සහ ජංගම දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය සඳහන් කළ යුතුය. විදුලි සේවාව සඳහා ඔබගේ ලියාපදිංචිය, ඔබගේ ඇස්තමේන්තු මුදල සහ ඉදිරියේදී ඔබගේ ප්‍රදේශයේ විදුලිය අත්හිටු වීම්, දීර්ඝ විදුලි බිඳ වැටීම්, ඔබගේ බිල්පත් සම්බන්ධ තොරතුරු හෝ ගෙවීම් වැනි තොරතුරු කෙටි පණිවිඩ සේවාව (SMS) මඟින් ඔබ වෙත දැනුම්දීමට මෙම ජංගම දුරකථන අංකය භාවිතා කිරීමට නියමිත බැවින් එම සේවාවන් ලබා ගැනීම සඳහා ඔබගේ නිවැරදි ජංගම දුරකථන අංකය මෙහි සඳහන් කිරීමට කටයුතු කරන්න.

7. විදුලි සැපයුම අවශ්‍ය පරිශ්‍රයට මීට පෙර විදුලි සේවා සැපයුමක් ලබා ගෙන තිබුණේ නම් එහි විදුලි ගිණුම් අංකය සඳහන් කළ යුතුය.

8. ඔබගේ අවශ්‍යතාව අනුව අදාල කොටුව තුල (✓) ලකුණ යොදන්න. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම් ළඟම තිබෙන ලංවිම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් විමසිය හැක.

   8.1. විදුලි සේවා සැපයුමක් ලබාගත් පසු ස්ථිරවම එය පවත්වා ගෙන යාමට අවශ්‍ය අයදුම්කරුවන්.

   8.2. පවත්නා සේවාවක් වැඩි දියුණු කිරීමක් සඳහා මෙහිදී දැනට පවතින සේවාව සටහන් කරන්න.

   උදා: පවත්නා සැපයුම එකලා 30A සබඳතාවයක් නම්, හිස් තැනෙහි IP 30A ලෙස සඳහන් කර, පවතින ගිණුම් අංකය ද ලියා දැක්විය යුතුය.

   පවත්නා සැපයුම තෙකලා 30A සබඳතාවයක් නම්, හිස් තැනෙහි 3P 30A ලෙස සඳහන් කර, පවතින ගිණුම් අංකය ද ලියා දැක්විය යුතුය.

8.3. තාවකාලික සේවා සැපයුමක් සඳහා අවශ්‍ය කාල සීමාව සඳහන් කළ යුතුය. මෙම සබඳතා අවශ්‍යතාවය අනුව, තාවකාලික පදනම මත, නිශ්චිත කාලයක් සඳහා ලබා දෙනු ලැබේ. (උදා: සැණකෙළි, කෙටි උත්සව, අවමංගල උත්සව ආදී )

9. ඔබ අයදුම් කිරීමට අපේක්ෂා කරන විදුලි සේවා සබඳතාවේ වර්ගය අනුව කොටුව තුළ (✓) සඳහන් කළ යුතුය. (15A සේවා සැපයුම් සබඳතා ලබා ගත හැක්කේ කොළඹ නගරයේ පමණක් බව කාරුණිකව සලකන්න)

10. ඔබගේ නව විදුලි සේවා සැපයුම අයදුම් කරනු ලබන අවශ්‍යතාවයට අදාල අරමුණ අනුව ඊට අදාල කොටුව සළකුණු කර දැක්විය යුතුය. යම් හෙයකින් ඔබගේ විදුලි අවශ්‍යතාවයේ අරමුණ ලැයිස්තුවේ නොමැති නම්, එය අයදුම්පතේ ඇති **<u>අදාල හිස් තැනෙහි සඳහන් කර දැක්විය යුතුය.</u>**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නිවාස | | හෝටල් | | වී මෝලක් / මිරිස් මෝලක් | | පොම්පාගාරය | |
| වෙළඳ සැල් | | කාර්යාල | | පැස්සුම් වැඩපොලක් | | කාර්මික | |
| ආගමික | | ලී/ගල් මෝලක් | | | | | |

11. දවසේ වේලාව අනුව ගාස්තු අය කරනු ලබන 'කාල පාදක අයක්‍රමය' සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් කොටුව තුළ (✓) සඳහන් කර දැක්විය යුතුය. මෙම අයක්‍රමයේ දී ඔබගේ විදුලි පරිභෝජනය වේලාව අනුව කාල පරාස තුනකට අනුව මැන අය කරනු ලැබේ. (දිවා කාලය, කාර්ය බහුල හා කාර්ය බහුල නොවන ලෙස) අදාල පරිච්ඡේදය තුල පරිභෝජනය කරන විදුලි ඒකක ප්‍රමාණයට එම කාලපරිච්ඡේදය සඳහා අනුමත ගාස්තුවට අනුව අය කිරීම් සිදු කරනු ලැබේ.

12. අදාල පරිශ්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන උපකරණ ලැයිස්තුව සඳහන් කර දැක්විය යුතුය.

13. නව විදුලි සේවා සැපයුමට අදාල විදුලි මනුව තාප්පයේ (මායිම් බිත්තියේ) ස්ථාපනය කරන්නේ නම් ඒ බව සඳහන් කර දැක්විය යුතුය.

14. සේවාව අවශ්‍ය පරිශ්‍රයේ GPS ඛණ්ඩාංක ඉල්ලුම්කරු දන්නේ නම්, එම අක්ෂාංශ හා දේශාංශ තොරතුරු දශම ආකාරයෙන් පිරවිය යුතුය.

උදාහරණ: කොළඹ 02, ලංවිම ප්‍රධාන කාර්යාලයේ GPS ඛණ්ඩාංක

අක්ෂාංශ: 6 . 9 3 0 3 2 3

දේශාංශ: 7 9 . 8 4 4 8 9 3

\



15. GPS ඛණ්ඩාංක නොදන්නේ නම් විදුලි සේවා සැපයුම අයදුම් කරන ස්ථානයට පහසුවෙන් ළඟා විය හැකි පරිදි දළ සැලැස්මක් දැක්විය යුතුය.

16. අයදුම්කරුගේ නමින් වෙනත් පරිශ්‍ර සඳහා විදුලි සැපයුම් ලබා ගෙන තිබේ නම් එම විදුලි ගිණුම් අංක සඳහන් කළ යුතුය.

17. සේවා රැහැන් වෙනත් අයෙකුගේ ඉඩමක් හරහා යෙදෙන්නේ නම් එය සඳහන් කළ යුතුය.

18. අයදුම්කරු විසින් අයිතම අංක 01 හි සඳහන් ලියකියවිලි වලින් එකක් සහ අයිතම අංක 02 හෝ අයිතම අංක 03 සඳහන් ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

19. අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සපයා ඇති සියලු තොරතුරු සත්‍ය බවට සහතික කොට, යම් හෙයකින් වෙනත් අයෙකුගේ ඉඩම්/නිවාස/දේපල හරහා අදින ලද රැහැන් මාර්ගයක් වෙනස් කිරීමට සිදුවුව හොත් ඒ සඳහා වැයවන සම්පූර්ණ මුදල ගෙවීමට ද පොරොන්දු වෙමින් සහ ගිවිසුම්ගත ධාරිතාවය ඉක්මවා නොයන පරිදි විදුලිය පරිභෝජනය කිරීමට පොරොන්දු වෙමින් සම්පූර්ණ අත්සන සහ දිනය යෙදිය යුතුය.